# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/27 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යෝජිත කටුපොත - බමුණාකොටුව - පඬුවස්නුවර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ රඹාවැව ඝණ මීටර් 2000 භූගත ජලාශය හා ඝණ මීටර් 450 ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1407

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර - නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ලැහැපිටිය 1362 ග්‍රාම නිලධාරී වසමේ පාතමුල්ල ගමේ පිහිටි කෝන්ගහමුල හේන සහ දන්ගහමුලහේන නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 80 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | ගම්සභා පාර ; |
| *නැගෙනහිරට* | ඃ | ගම්සභා පාර ; |
| *දකුණට* | ඃ | කැබලි අංක 2 ඉතිරි ඉඩම ; |
| *බටහිරට* | ඃ | කැබලි අංක 2 ඉතිරි ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය ඃ* විජේසිංහ ආරච්චිගේ සුනිල් විජේසිංහ,
පාතමුල්ල - කනන්තේවැව.

09 - 356


1A - G 28380 — 27 (2018/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ මලාපවහන නල මාර්ග එලීම සඳහා ඉඩම් කොටස්වල පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1408

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 837, කුරුණෑගල නගරය - බටහිර ග්‍රාම නිලධාරී වසමේ කුරුණෑගල නගරය මීගමු පාර ගමේ පිහිටි හකුරුකැටියාව නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 2.5 පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක :

01. කැබලි අංක 1 ඉඩමේ නම (අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 8 (d) වලින් කොටසක්) ඉඩමේ ප්‍රමාණය පර්චස් 1.5
ඉඩමේ මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 හා කැබලි අංක 8 (a); |
| *නැගෙනහිරට* | : | අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 හා කැබලි අංක 9 ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා අංක 1927 දරන බලයලත් මිනින්දෝරු කැබලි අංක 8 (a). |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම් හා ලිපිනයන්* : 1. බී.එම්. චන්ද්‍රාවතී කුමාරිහාමි මහත්මිය,
අංක 7/3, 3 වැනි පටුමග, මීගමු පාර, කුරුණෑගල.

2. ස්වර්ණා කිරින්ද මහත්මිය,
අංක 7/3, 3 වැනි පටුමග, මීගමු පාර, කුරුණෑගල.

02. කැබලි අංක 2 ඉඩමේ නම (අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 8 (a) වලින් කොටසක්) ඉඩමේ ප්‍රමාණය පර්චස් 01
ඉඩමේ මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 හා ගුණවර්ධන මහත්මිය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | අංක 1927 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | ගුණවර්ධන මහත්මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 1. ස්වර්ණා කිරින්ද මහත්මිය,
අංක 7/3, 3 වැනි පටුමග, මීගමු පාර, කුරුණෑගල.

09 - 357